


**මෙම සමාගමේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොල පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පී (පින්තාරු )11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය** : අධීක්ෂණ නිළධාරින් විසින් පවරනු ලබන සියළුම පින්තාරු වැඩ අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව ඉටු කිරිම.

**රැකියාවේ වගකීම් :**

1 සියළුම ගොඩනැගිලිවල පින්තාරු කටයුතු සිදු කිරිම.

11 අභ්‍යන්තර හා බාහිර බිත්ති, දළඹ, වහල , සිවිලිම, හා දොරවල් ගුවන් තොටුපොලට අයත් භාණ්ඩ මුර පොලු, ගේට්ටු , මාර්ග සළකුණු, ගුවන් යානා ධාවන පථ , ඒප්‍රන් සලකුණු , සහ අලංකාර වශයෙන් යෙදුන වැටවල් යනාදි සියළුම දෑ පින්තාරු කිරිම.

111 සේවා ස්ථානයට අයත් උපකරණ පිරිසිදු කිරිම හා ඒවා හොඳ තත්ත්වයෙන් නඩත්තු කිරිම.

1V අධික්ෂණ නිළධාරින් නියම කරන උපකරණ හා ද්‍රව්‍ය ගබඩාවෙන් ලබා ගැනීම, ඒවා සුරක්ෂිතව පරිහරණය කිරිම හා සුදුසු ස්ථානවල තැබීමට කටයුතු කිරිම

V උපකරණ ආරක්ෂාකාරී ලෙස පරිහරණය කිරිම සහ ඒවා පරිහරණයේදී අලාබහානි නොවන අන්දමට ප්‍රයෝජන ගැනීම, පින්තාරු කිරිමේදී එම ස්ථානයේ ඇති අනෙකුත් ද්‍රව්‍ය හා භාණ්ඩ වලට අලාභ හානි නොවන පරිදි කටයුතු කිරිම

VI පරිහරණය කල ද්‍රව්‍ය හා ඒවා ප්‍රයෝජනයට ගත් අයුරු සටහන් කර තැබිම හා ඉතිරි ද්‍රව්‍ය උප ගබඩාවට භාරදීම

VII පලංචි බැඳීම සඳහා බඩු භාර දීම හා ගැනීම, පලංචි සවි කිරිම, ගැලවිම හා ඒවා නැවත භාරදීම.

02/-

**සුදුසුකම් :**

(අ) කාර්මික විද්‍යාලයක් මගින් හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (T.V.E.C) විසින් පිළිගනු ලබන ආයතනයක් මගින් හෝ පවත්වනු ලබන පූර්ණ කාලීන එක් (01) අවුරුදු පුහුණු පාඨමාලාවක් පින්තාරු ක්ෂේත්‍රයෙන් සාර්ථකව හදාරා තිබීම.

**සහ**

ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සිමාවද ඇතුළත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**නැතහොත්**

(ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (T.V.E.C) විසින් නිකුත් කරනු ලබන NVQ Level 3 සහතිකයක් පින්තාරු ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතු අතර වසර හයක (06) සේවා පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුයි.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට අඩු විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් පහත සඳහන් ලිපිනයට 2023 **ඔක්තෝබර් මස 18 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පි (පින්තාරු) II වන ශ්‍රේණිය** යන තනතුර සඳහන් කළ යුතුවේ.
තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

පාඨමාලා සහතික හා සේවා සහතික සහ අදාළ සහතිකවල ජායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්) ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Date :05/10/2023